**හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව.**
**2019.07.22**

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම ගරු සම සභාපති හා දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර කීර්ති තෙන්නකෝන් මැතිතුමා සහ ගරු සම සභාපති හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන හා ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ ගරු රාජ්‍ය අමාත්‍ය දිලිප් වෙදආරච්චි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2019.07.22 වන සඳුදා දින පෙ.ව 9.00 ට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදි.

ප්‍රථමයෙන්ම, රැස්වීමට සහභාගී වූ ගරු සභාපතිතුමන්ලා ප්‍රමුඛ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් පාලන ආයතනවල ගරු සභාපතිතුමන්ලා, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල ගරු සභාපතිතුමන්ලා ඇතුළු ආරාධිත නිලධාරීන් සහ සියළුම රාජ්‍ය හා අනෙකුත් ආයතනවල නිලධාරීන් ද දිස්ත්‍රික් ලේකම් විසින් පිළිගනිමින් දිස්ත්‍රික්කයේ සංවර්ධන ගැටළු, සෞඛ්‍ය හා සනීපාරක්ෂක ගැටළු, හදිසි ආපදා තත්ත්වයන් හා අනෙකුත් සියළු සුභසාධක ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීමට අපේක්ෂිත බව ප්‍රකාශ කරන ලදි.

අනතුරුව, පසුගිය රැස්වීම් වාර්තාව සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ අතර, සංශෝධන කිසිවක් නොවූ බැවින් වාර්තාව සභා සම්මත විය.

ඉන්පසුව න්‍යායපත්‍රානුකූලව සාකච්ඡා කළ කරුණු හා තීරණ පහත පරිදි වේ.

| 01 | **2019.05.27 වන දින පැවති රැස්වීමේදී ගනු ලැබූ තීරණ පිළිබඳ ප්‍රගතිය.** |
|---|---|

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 1.1 | වනජීවී | බෝගහවැව දෙව්රම් වෙහෙර හරහා මහවැව මාර්ගයේ ඉදිවෙමින් පවතින විදුලි වැටෙහි ගමන් මාර්ගය වෙනස් වීම හේතුවෙන් හේන් ගොවීන් අපහසුතාවයට පත් වීම. | දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් හා ප්‍රාදේශීය ලේකම්, වනජීවී, වන සංරක්ෂණ, කෘෂිකර්ම අධ්‍යක්ෂ හා හේන් ගොවීන්ගේ සහභාගීත්වයෙන් 2019.07.08 වන දින ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කළ බව වාර්තා විය. | ක්ෂේත්‍ර පරීක්ෂණයේ නිගමන අනුව ඉදිරි කටයුතු කිරීමට තීරණය විය | සහකාර අධ්‍යක්ෂ - වන ජීවී |
| 1.2 | මිරිදිය ධීවර කර්මාන්තය | බූන්දල ලුණු ලේවායේ අප ජලය බූන්දල කලපුවට මුදා හැරීම නිසා කලපුවේ මත්ස්‍ය සම්පත විනාශ වීම හේතුවෙන් මතු වී ඇති ගැටළු | මේ සම්බන්ධයෙන් ලුණු සංස්ථාව දැනුවත් කර ඇති බව සහකාර අධ්‍යක්ෂ (ආපදා කළමනාකරණ) විසින් ප්‍රකාශ කරන ලදි. ධීවරයින් මුහුණ පා ඇති ගැටළු නිරීක්ෂණය කිරීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කළ බවට කරුණු වාර්තා විය. | ලුණු සමාගම විසින් අදාල වන්දි මුදල් ගෙවීම හෝ වෙනත් සහන වැඩපිළිවෙලක් සම්බන්ධයෙන් කටයුතු කිරීම සුදුසු බව තීරණය විය. | සභාපති, ලුණු සමාගම |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 1.3 | ඉඩම් | වීරවිල නව නගර සැලැස්ම යටතේ ඉදිකරන ලද ව්‍යාපෘති නිසි පරිදි භාවිතා නොකිරීම | ලුණුගම්වෙහෙර, බෙරලිහෙල සඳහා වූ සැලැස්ම පමණක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් මේ වන විට අනුමත කර ගෙන ඇති බව වාර්තා විය. මේ සම්බන්ධයෙන් ඉඩම් සමීක්ෂණයක් සිදු කරමින් පවතින බවත්, මහනගර සැලැස්මට ප්‍රමුඛතාවය දීම හේතුවෙන් එම කටයුතු ප්‍රමාද වූ බවත් නාගරික සංවර්ධන අධිකාරිය ප්‍රකාශ කරන ලදි. | දැනට සකස් කර ඇති සැලැස්ම තවදුරටත් සංවර්ධනය කර මීළඟ කමිටුවට ඉදිරිපත් කිරීමට තීරණය විය. | නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය |
| 1.4 | විදුලිබල | විදුලි රැහැන්වලට බාධා වන ගස් කපා ඉවත් කිරීමේ දී මතු වී ඇති ගැටළු | විදුලිබල මණ්ඩලයෙන් පැමිණ සිටි ඉංජිනේරුවරයා කරුණු ඉදිරිපත් කිරීමේ දී පැහැදිලි වූයේ මෙම කාර්යය සඳහා දැනට යම් යම් පුද්ගලයන් සමඟ ගිවිසුම්ගත වීමේ දී අතු කපා ඉවත් කිරීමට ගිවිසුම් ගත වුවත්, කපා දැමූ අතු ඉවත් කිරීම නාගරික ප්‍රදේශවල පමණක් ඉවත් කරන බවකි. ග්‍රාමීය ප්‍රදේශවල ඔවුන් එය අධීක්ෂණය නොකරන බවකි. දැනට එම කපා දමන ශාක කොටස් ප්‍රාදේශීය සභාවන් විසින් ඉවත් කරන බව හෙලි විය. එහෙත් මෙතෙක් කල් විදුලිබල මණ්ඩලය විසින් මෙම ශාක කොටස් කපා දමන කොන්ත්‍රාත්කරුවන්ට එම කොටස් කපා දැමීමට පමණක් නොව ඉවත් කිරීමට ද මුදල් ගෙවා ඇත. ගිවිසුම් ප්‍රකාරව කාර්ය ඉටු නොවුව ද, මේ අනුව විදුලිබල මණ්ඩලය මුදල් ගෙවා ඇති බව හෙලි විය. | | |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| | | | කොන්ත්‍රාත් ආයතන විසින් කපා දමන ගස්වල අතු ඉවත් කිරීම ප්‍රාදේශීය සභාවන්ට කිරීමට සිදු වී ඇති බැවින් ගස් කපා ඉවත් කිරීමේ බලය පවරන ලෙස තිස්ස, තංගල්ල, සූරියවැව ප්‍රාදේශීය සභාවන් විසින් මේ වන විටත් ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව වාර්තා විය. | ගස් ඉවත් කිරීම සඳහා අනුමත ගාස්තු හා මිල ගණන් යටතේම ප්‍රාදේශීය සභාවන්ට පැවරීම සුදුසු බවටත්, ඒ පිළිබඳ නියාමනය කිරීම අත්‍යාවශ්‍ය වන බවටත් උපදෙස් ලබා දුනි. | පළාත් පාලන කොමසාරිස් - හම්බන්තොට / ප්‍රධාන විදුලි ඉංජිනේරු / අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) |
| 1.5 | තැපැල් | හතරකුට්ටුහේන උප තැපැල් කාර්යාලයේ ලිපි බෙදා දීම ප්‍රමාද වීම | මේ සම්බන්ධයෙන් නියෝජ්‍ය තැපැල්පති හා තැපැල්පති ලිඛිතව දැනුවත් කර අදාල සම්බන්ධීකරණ කටයුතු සිදුකර ඇති බව අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) විසින් ප්‍රකාශ කරන ලදි.<br>ලිපි බෙදාදීම සඳහා තැපැල් කරුවකු යෙදවීම මඟින් ගැටළුව නිරාකරණය කර ගත හැකි බවට අදහස් ඉදිරිපත් විය.<br>සුම්හිරිගම ප්‍රදේශයේ තැපැල්කරු විසින් ම මෙම මගහැරෙන නිවාස සඳහා ලිපි බෙදා දීමට හැකි බැවින් ඒ බව වාර්තා කරන බවට තැපැල් දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් ප්‍රකාශ කරන ලදි. | වාර්තාවන්ගෙන් පමණක් ඵලක් නොවන බැවින් දැනට ලිපි බෙදීම සිදු නොවන පවුල් සඳහා කඩිනමින් ලිපි බෙදා දීමට අවශ්‍ය කටයුතු කරන ලෙස දන්වන ලදි. | ප්‍රාදේශීය තැපැල් අධිකාරී |
| 1.6 | මත්ද්‍රව්‍ය නිවාරණ | තිස්සමහාරාම දෙබරවැව පවත්වාගෙන යනු ලබන සුරා සැල වෙනත් සුදුසු ස්ථානයක ස්ථාපිත කිරීම | සුරාසැල වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම සඳහා සුරාබදු අධිකාරී කාර්යාලය විසින් බලපත්‍රධාරියා දැනුවත් කර ඇති බව වාර්තා විය. | දෙසැම්බර් මාසයේදී බලපත්‍ර නැවත අලුත් කිරීම සිදු නොකරන ලෙස උපදෙස් ලබා දුනි | ප්‍රාදේශීය ලේකම්, තිස්සමහාරාමය / සුරාබදු අධිකාරී |
| 1.7 | ඉඩම් | වීරකැටිය පස්මංහන්දිය සංවර්ධනය කිරීමේ දී පවරා ගත් ඉඩම් සඳහා වන්දි මුදල් ලබා දීම ප්‍රමාද වීම | ඉඩම් කැබලි 08ක් සඳහා පමණක් මේ වන විට මුදල් ඉල්ලා ඇති බව වාර්තා විය. තවත් ඉඩම් කැබලි 147ක් තක්සේරුව සඳහා ඉදිරිපත් කර ඇති බවට වීරකැටිය ප්‍රාදේශීය ලේකම් විසින් වාර්තා කරන ලදි.<br>එකී ලේඛනවල ගැටළු අවස්ථා තිබෙන බවට තක්සේරු නිලධාරී විසින් දන්වන ලදි. | මේ සම්බන්ධයෙන් අදාල සියළුම පාර්ශව සමඟ රැස්වීමක් කැඳවා ගැටළු නිරාකරණය කර ගැනීමට කටයුතු කර ප්‍රගතිය වාර්තා කිරීමට තීරණය විය. | ප්‍රාදේශීය ලේකම්, වීරකැටිය. |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 1.8 | ඉඩම් | අම්බලන්තොට ප්‍රාදේශීය සභාව සඳහා කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ඉඩමක් ලබා ගැනීම | 2019.06.27 දින ක්ෂේත්‍ර පරීක්ෂණයෙන් හඳුනාගත් වී අලෙවි මණ්ඩලයට හිමි, දැනටමත් ප්‍රාදේශීය සභාව භුක්ති විඳින ඉඩම සුදුසු බැවින් එහි මැනීම් කටයුතු සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බව වාර්තා විය. | ඒ සම්බන්ධ ඉදිරි කටයුතු කඩිනමින් සිදු කිරීමට තීරණය විය. | ගරු සභාපති, අම්බලන් තොට ප්‍රාදේශීය සභාව / ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී - හම්බන්තොට / ප්‍රාදේශීය ලේකම්, අම්බලන් තොට |
| 1.9 | පොදු සේවා | බෙලිඅත්ත දුම්රිය ස්ථානය අසල පහසුකම් ප්‍රමාණවත් නොවීම | සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීමට අදාල ඇස්තමේන්තුවක් ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත යවා ඇති බව වාර්තා විය.<br>මාතර - කතරගම දුම්රිය මාර්ගයේ ඉදිකිරීම් කටයුතුවලදී ජල උල්පතකට හානි වී ඇති බව ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත දන්වා යවා ඇති බව පරිසර අධිකාරිය විසින් ප්‍රකාශ කරන ලදි. ව්‍යාපෘති අධ්‍යක්ෂ මේ සම්බන්ධ රැස්වීම් කිහිපයක් සඳහා ම කැඳවීම් කළ ද සහභාගී වී නොමැති බව වාර්තා විය. | මේ සම්බන්ධයෙන් කරුණු දැක්වීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ අනිවාර්යෙන්ම ඉදිරිපත් විය යුතු අතර, හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් සමඟ සාකච්ඡා කර මෙම ගැටළු විසඳන ලෙස දැන්වීමට තීරණය විය. | ව්‍යාපෘති අධ්‍යක්ෂ - මාතර කතරගම දුම්රිය මාර්ග ව්‍යාපෘතිය. |
| 1.10 | ඉඩම් | හම්බන්තොට සිරිබෝපුර ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නිවාස ව්‍යාපෘතිය සඳහා සුදුසු ඉඩම් හඳුනා ගැනීම | මේ සඳහා වෙන් කර ඇති ඉඩම මහවැලි අධිකාරිය සතු ඉඩමක් වන අතර ඉඩම් කොටස් නිරවුල් කර ගැනීම සම්බන්ධයෙන් මහවැලි අධිකාරිය වෙත දන්වා යවා ඇති බව වාර්තා විය. | ඉඩම නිදහස් කිරීමේ කටයුතු කඩිනමින් ඉටු කිරීමට උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට /නේවාසික ව්‍යාපාර කළමනාකරු - මහවැලි අධිකාරිය |
| 1.11 | කෘෂිකර්ම | බඳගිරිය තණබිම ගවයන්ගේ පරිභෝජනය සඳහා යොදා ගැනීමට අවසර ලබා ගැනීම | මේ සම්බන්ධ අනුමැතිය ලබා ගැනීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉල්ලීම් කර ඇති බව වාර්තා විය. | එම ඉල්ලීම් ලිපියේ පිටපතක් අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) වෙත ලබා දෙන ලෙස උපදෙස් ලබා දුනි.<br><br>මේ සම්බන්ධයෙන් වන සංරක්ෂණ කොමසාරිස් ජනරාල් දැනුවත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | අධ්‍යක්ෂ - කෘෂිකර්ම<br><br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 1.12 | වාරි මාර්ග | නිදහස්ගම නැගෙනහිර ගොවි ජනතාව උදෙසා උස්සාන වාරි මාර්ග ක්‍රමයක් ඇති කිරීම | මෙම වසරේ ප්‍රතිපාදන මත ඇස්තමේන්තු සකස් කිරීමේ ගැටළු කිහිපයක් පවතින බව පළාත් වාරිමාර්ග ඉංජිනේරු හා දිස්ත්‍රික් ඉංජිනේරු විසින් කරුණු දක්වන ලදි. | මධ්‍යම වාරිමාර්ග, කෘෂිකර්ම, ප්‍රජා ජල, පළාත් ගොවිජන සේවා, ප්‍රාදේශීය සභාව හා පරිසර අධිකාරිය සම්බන්ධීකරණය කර රැස්වීමක් සංවිධානය කරන ලෙස සහ ඇස්තමේන්තු සකස් කර මීළඟ රැස්වීමට ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - තංගල්ල / දිස්ත්‍රික් ඉංජිනේරු - පළාත් වාරිමාර්ග කාර්යාලය, හම්බන්තොට |
| 1.13 | මාර්ග සංවර්ධන | ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද මැඩිල්ල පාලමේ විකල්ප මාර්ගය ඉවත් කිරීමේ දී මතු වී ඇති ගැටළු | කළපු ඉස්සන් බෝකරන ස්ථානය සඳහා පිවිසීම හා සංචාරක කර්මාන්තය අරමුණු කරගනිමින් මෙම පාලම ඉදිකර ඇති බවත්, ඒ සඳහා ඉදිකරන ලද විකල්ප මාර්ගය ආසන්නයේ අනවසර හෝටල්කරුවකු හේතුවෙන් ගැටළු පැනනැගී ඇති බවත් වාර්තා විය. | මේ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු කිරීමට තීරණය විය. | පළාත් පාලන සහකාර කොමසාරිස් |
| 1.14 | ඉඩම් | අඟුණුකොළපැලැස්ස පොළ ඉදිරිපිට නිලාන් චමින්ද මහතාට අයත් ඉඩමේ කඩ කාමරයක් ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම | 2018.2.26 සම්බන්ධීකරණ කමිටු තීරණය පරිදි මෙම ඉඩම රථගාලක් සඳහා අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව වෙත වෙන්කර ඇති බවත්, මහවැලි අධිකාරිය විසින් ඉන් පර්චස් 03ක කොටසක් නිලාන් චමින්ද මහතාට ලබා දී ඇති බවත් වාර්තා විය. | රථගාල සඳහා ප්‍රාදේශීය සභාවට වෙන්කිරීමට තීරණය කර ඇති මෙම භූමියෙන් කොටසක් මහවැලි අධිකාරිය විසින් තනි පුද්ගලයකුට ලබාදීම ගැටළු සහගත බව ප්‍රකාශ කරන ලදි. මේ සම්බන්ධ සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | පළාත් පාලන සහකාර කොමසාරිස් / නේවාසික ව්‍යාපාර කළමනාකරු - මහවැලි අධිකාරිය |
| **2019.07.22 වන දින රැස්වීමේ දී සාකච්ඡා වූ කරුණු හා ගනු ලැබූ තීරණ** | | | | | |
| **02** | **සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය ඉදිරිපත් කිරීම** | | | | |
| 2.1 | සංවර්ධන ව්‍යාපෘති | 2019 වර්ෂයේ හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා අනුමත වී ඇති ප්‍රතිපාදන | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, ජනාධිපති ලේකම් කාර්යාලය, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය, නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ රුපියල් මිලියන 1590.56 ක මුදලක් අනුමත වී ඇති බව ප්‍රකාශ කරන ලදි. | | අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 2.2 | සංවර්ධන ව්‍යාපෘති | විමධ්‍යගත අයවැය වැඩසටහන. 2019.07.18 දිනට ප්‍රගතිය | ගරු මන්ත්‍රීතුමන්ලාගේ යෝජනා 691ක් ඉදිරිපත් වී ඇති අතර, එම යෝජනා 691 සඳහා රුපියල් මිලියන 71.25ක් අනුමත වී ඇති බවත්, ව්‍යාපෘති 25ක වැඩ අවසන් කර ඇති බවත් වාර්තා විය.මෙම කමිටුව වෙත ඉදිරිපත් කරන ලද යෝජනා සියල්ල අනුමත කරන ලදි. | | අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) |
| 2.3 | සංවර්ධන ව්‍යාපෘති | ගම්පෙරළිය කඩිනම් ග්‍රාමීය සංවර්ධන වැඩසටහනේ වර්තමාන ප්‍රගතිය ඉදිරිපත් කිරීම | තිස්සමහාරාමය, තංගල්ල, බෙලිඅත්ත හා මුල්ගිරිගල ආසනවල ව්‍යාපෘති 1792ක් සඳහා රුපියල් මිලියන 801.816ක් වෙන් කර ඇති බවත්, ඉන් ව්‍යාපෘති 374ක් වැඩ අවසන් කර ඇති බවත් වාර්තා විය.<br>නිවාස 107ක් සඳහා විදුලිය ලබා දීමට රුපියල් මිලියන 3.2ක මුදලක් අනුමත වී ඇති බවත්, නිවාස 820ක තාවකාලික වහල ස්ථිර වහල බවට පරිවර්තනය කිරීම සඳහා රු.මි. 82.69ක මුදලක් අනුමත වී ඇති බවත් වාර්තා විය. විවිධ ගැටළුකාරී තත්ත්වයන් නිසා බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රගතිය අඩු වී ඇති බවට ප්‍රකාශ කරන ලදි. | | අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) |
| 2.4 | සංවර්ධන ව්‍යාපෘති | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහනේ වර්තමාන ප්‍රගතිය ඉදිරිපත් කිරීම | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘති 126ක් සඳහා රු.මි. 175.82ක මුදලක් අනුමත වී ඇති බවත්, ඉන් ව්‍යාපෘති 11ක වැඩ අවසන් කර ඇති බවත් වාර්තා විය.<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘති 5ක් සඳහා රු.මි. 141.82ක් අනුමත වී ඇති බවත්, එම ව්‍යාපෘතිවල ප්‍රසම්පාදන කටයුතු අවසන් බවත් වාර්තා විය. | | අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) |
| 2.5 | සංවර්ධන ව්‍යාපෘති | හම්බන්තොට දිස්ත්‍රික් ජනාවාස ආශ්‍රිත ප්‍රවේශ මාර්ග වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය ඉදිරිපත් කිරීම | ව්‍යාපෘති 186ක් සඳහා රු.මි. 200.00ක මුදලක් අනුමත වී ඇති බවත්, ව්‍යාපෘති 55ක වැඩ අවසන් කර ඇති බවත් වාර්තා විය. | | අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) / සියළුම ප්‍රාදේශීය ලේකම්වරු |
| 2.6 | සංවර්ධන ව්‍යාපෘති | සුබිත පුරවර වැඩසටහනේ වර්තමාන ප්‍රගතිය ඉදිරිපත් කිරීම | ව්‍යාපෘති 11ක් සඳහා රු.මි. 9.8ක් අනුමත වී ඇති බවත්, ව්‍යාපෘති 3ක වැඩ අවසන් කර ඇති බවත් වාර්තා විය. | | අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) |
| 2.7 | සංවර්ධන ව්‍යාපෘති | දියවර පියස නිවාස සංවර්ධන වැඩසටහනේ වර්තමාන ප්‍රගතිය ඉදිරිපත් කිරීම | තංගල්ල, හම්බන්තොට හා තිස්සමහාරාමය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ප්‍රතිලාභීන් 100 දෙනෙකු සඳහා රු.මි. 10.25ක් අනුමත වී ඇති අතර මූල්‍ය ප්‍රගතිය රු.මි. 2.22ක් හා භෞතික ප්‍රගතිය 45%ක් වන බව වාර්තා විය. | | අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 2.8 | සංවර්ධන ව්‍යාපෘති | අතිගරු ජනාධිපතිතුමන් විසින් සිදු කරන ලද තිස්සමහාරාම පුල්පල්ලම ග්‍රාම නිලධාරී වසමේ නිරීක්ෂණ චාරිකාවේ දී රන්මිණිතැන්න ග්‍රාම ශක්ති ජනතා සමිතිය මඟින් ඉදිරිපත් කරන ලද ගැටළුවලට අදාල වර්තමාන ප්‍රගතිය ඉදිරිපත් කිරීම | අභ්‍යන්තර මාර්ග 30ක් සංවර්ධනය කිරීම යටතේ මාර්ග 11ක වැඩ අවසන් බවත්, ජල ව්‍යාපෘතියේ 25%ක වැඩ අවසන් කර ඇති බවත්, රන්මිණිතැන්න කණිෂ්ඨ විද්‍යාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති බවත්, වැසිකිළි 138ක් සඳහා ද්‍රව්‍ය ලබා ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇති බවත්, සේවා පියසක් ඉදිකිරීම සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන ඉල්ලා ඇති බවත්, කමත් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 20%ක වැඩ අවසන් කර ඇති බවත්, කෘෂි මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ වැඩ 25%ක් අවසන් කර ඇති බවත්, අලිවැටක් ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන අනුමත වුව ද, හේන් ගොවීන්ගේ විරෝධයක් ඇති බව සහ උස්සාන ජල ව්‍යාපෘතියේ මූලික කටයුතු ආරම්භ කර ඇති බවත් වාර්තා විය. | | අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) / ප්‍රාදේශීය ලේකම් - තිස්සමහාරාමය |
| 2.9 | සංවර්ධන ව්‍යාපෘති | ග්‍රාමශක්ති ජනතා සමිතිවල වර්තමාන ප්‍රගතිය ඉදිරිපත් කිරීම | සමිති 136ක් පිහිටුවා අවසන් බවත්, කුඩා කණ්ඩායම් 500ක්, පර්ශද 100ක් සහ VISCO ආයතන 23ක් පිහිටුවා ඇති බවත්, ධාරිතා සංවර්ධන වැඩසටහන් 37ක් හා යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් 25ක් ක්‍රියාත්මක කර ඇති බව වාර්තා විය. | | අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) / සියළුම ප්‍රාදේශීය ලේකම්වරු |
| 2.10 | සංවර්ධන ව්‍යාපෘති | පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘතිවල වර්තමාන ප්‍රගතිය ඉදිරිපත් කිරීම | සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ව්‍යාපෘති 04ක් සහ හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ව්‍යාපෘති 3ක් ක්‍රියාත්මක කර ඇති බවත්, අඟුණකොළපැලැස්ස සහ බෙලිඅත්ත ප්රාදේශීය ලේකම් කොට්ඨාසවල ව්‍යාපෘති 2ක් සඳහා ගිවිසුම් අත්සන් කර ඇති බවත් වාර්තා විය.<br>හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සාමෝදාගම සල් මල් යාය ප්‍රදේශයට පානීය ජලය ලබා දීමේ ව්‍යාපෘතිය චීන සැපයුම් හා කර්මාන්ත කලාපයට අයත් වන බව මහවැලි අධිකාරිය විසින් දන්වා ඇති බව ප්‍රකාශ කරන ලදි.<br>එසේ වුව ද පානීය ජලය මූලික අවශ්‍යතාවයක් සේ සලකා එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදි. | | අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) / හම්බන්තොට හා සූරියවැව ප්‍රාදේශීය ලේකම් |
| 2.11 | සංවර්ධන ව්‍යාපෘති | ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වියාපෘතිවල වර්තමාන ප්‍රගතිය ඉදිරිපත් කිරීම | ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති 32න් 06ක් සඳහා රු.මි. 1.12ක් ද, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන යටතේ ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති 12න් 1ක් සඳහා රු.මි.0.05ක් ද, වකුගඩු රෝග නිවාරණ වැඩසටහන යටතේ ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති 17න් 10ක් සඳහා රු.මි. 0.42ක් ද අනුමත වී ඇති බවත්, දරුවන් සුරකිමු වැඩසටහන යටතේ ව්‍යාපෘති 14ක් සහ පරිසර සංරක්ෂණ වැඩසටහන යටතේ ව්‍යාපෘති 5ක් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යවා ඇති අතර ඒ සඳහා මෙතෙක් අනුමැතිය ලැබී නොමැති බවත් වාර්තා විය. | | අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 03 | **විශේෂ කරුණු** | | | | |
| 3.1 | ජල සම්පාදන | හම්බන්තොට කලාපය සඳහා යෝජිත ජල සම්පාදන හා මලාපවහන ව්‍යාපෘතිය පිළිබඳව දැනුවත් කිරීම | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පරිගණකගත ඉදිරිපත් කිරීමක් මඟින් දැනුවත් කිරීම සිදු කරන ලදි.<br>ආයෝජන ප්‍රවර්ධන කලාපයේ ජල අවශ්‍යතාවය, චීන විශේෂ ආර්ථික කලාපයේ ජල අවශ්‍යතාවය හා ජලාපවහන පහසුකම් සැපයීම මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂා කරන බව ප්‍රකාශ කරන ලදි.<br>ජල සම්පාදන ව්‍යාපෘතිය උඩවලව ජලාශය පදනම් කරගත් ව්‍යාපෘතිය හා මුහුදු ජලය ප්‍රතිආශ්‍රැතිකරණය වශයෙන් සැලසුම් 2ක් යටතේ ක්‍රියාත්මක වන බව ප්‍රකාශ කරන ලදි.<br>මිරිජ්ජවිල ආශ්‍රිත දකුණු මුහුදු තීරයෙන් ජලය ලබාගෙන පිරිපහදු කොට අප ජලය දක්ෂිණ මුහුදු තීරයේ වෙරළට මීටර 700ක් පමණ දුරින් මුදා හරින බවට ප්‍රකාශ කරන ලදි.<br>මලාපවහන ව්‍යාපෘතිය යටතේ දිනකට ඝන මීටර 40,000 ක් පමණ පිරිපහදු කොට අප ජලය දක්ෂිණ මුහුදු තීරයේ මීටර 40ක් පමණ ඇතුළට මුදාහරින බව ප්‍රකාශ කරන ලදි.<br>ගිංනිල්වලා ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුවහොත් මෙම ව්‍යාපෘති 2 අවශ්‍ය නොවන බව ද දන්වන ලදි. | ඉදිරියේ දී පවතින තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් තීරණයක් ගැනීම සඳහා විකල්ප සැලසුම් හඳුනාගැනීම අවශ්‍ය බවට තීරණය විය.<br>මුහුදු ජලය ප්‍රතිආශ්‍රැතිකරණ ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවට ආධුනික වන බැවින් එවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී හොඳින් සොයා බලා කළ යුතු බවට උපදෙස් ලබා දෙන ලදි.<br>අප ජලය වියළි කලාපය අභ්‍යන්තරයේ ප්‍රයෝජනය සඳහා යෙදවීමේ හැකියාව පිළිබඳ අවධානය යොමු කරන ලෙස ද දන්වන ලදි. | ජල සම්පත් මණ්ඩලය<br>ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 3.2 | සෞඛ්‍ය | හම්බන්තොට මහ රෝහලේ සහ තංගල්ල මූලික රෝහලේ "මිතුරු පියස" මධ්‍යස්ථානය පිළිබඳ දැනුවත් කිරීම | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් පරිගණකගත ඉදිරිපත් කිරීමක් මඟින් දැනුවත් කිරීම සිදු කරන ලදි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය හා බැඳුනු සිදුවීම්වලදී උපදේශන මධ්‍යස්ථානයක් ලෙස මෙය ක්‍රියාත්මක වන බව ප්‍රකාශ කරන ලදි.<br>උපදේශන සේවාවන් ලබා දීම, විශාදය වැනි රෝගී තත්ත්වයන්ට ලක්වී සිටී නම් අවශ්‍ය ප්‍රතිකාර ලබා දීම, අවශ්‍ය අවස්ථාවලදී නීති ආධාර සඳහා යොමු කිරීම මෙහිදී සිදු වන බව සහ සියළු තොරතුරුවල රහස්‍ය භාවය ආරක්ෂා කරන බව ද ප්‍රකාශ කරන ලදි.<br>දුරකථන ඇමතුමක් මඟින් හෝ තමා විසින් ම එම ස්ථානයට ගොස් අවශ්‍ය කටයුතු සිදු කර ගත හැකි බවද දන්වන ලදි. තව ද, රෝහල්, වාට්ටු, සායන, පොලීසිය, ගුරුවරුන් වැනි අය යොමු කරන අය සඳහා ද සේවාවන් ලබා දෙන බව ප්‍රකාශ කරන ලදි. | මේ පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස උපදෙස් ලබා දෙන ලදි. | සියළුම ආයතන ප්‍රධානීන් |
| 3.3 | ඩෙංගු මර්දන කටයුතු | ඩෙංගු මර්දන කටයුතුවල ප්‍රගතිය ඉදිරිපත් කිරීම | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් පරිගණකගත ඉදිරිපත් කිරීමක් මඟින් ප්‍රගතිය ඉදිරිපත් කරන ලදි.<br>අවදානම් කලාප කාණ්ඩ 03ක් යටතේ හඳුනාගෙන ඇති බවත්, අධි අවදානම් කලාපය ලෙස තංගල්ල හඳුනාගෙන ඇති බවත් වාර්තා විය.<br>තංගල්ල මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාසය තුළ රෝගීන් 217ක් හඳුනාගෙන ඇති බවත්, එම ප්‍රදේශවලට ප්‍රමුඛ අවධානය යොමු කරමින් මර්දන කටයුතු සිදු කරමින් පවතින බවත් වාර්තා විය. | | |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| | | | විශේෂ ධූමායන වැඩසටහන් හා විශේෂ නිවාස පරීක්ෂා වැඩසටහන් හා සෞඛ්‍ය අධ්‍යාපන ප්‍රචාරක වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතින බව වාර්තා විය. | සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පමණක් මෙම කටයුතු සිදු කළ නොහැකි බැවින් මර්දන කටයුතු සඳහා සියළුම පාර්ශවයන්ගේ සහයෝගය ලබා දීම සුදුසු බව තීරණය විය. | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ / සියළුම ආයතන ප්‍රධානීන් |
| 3.4 | නගර සංවර්ධන | හම්බන්තොට මහානගර සභා සැලැස්ම ඉදිරිපත් කිරීම | නාගරික සංවර්ධන අධිකාරිය විසින් මේ පිළිබඳ පරිගණකගත ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදි.<br>දකුණු ආසියාවේ පිබිදෙන මුව දොර යන දැක්ම යටතේ සැලැස්ම ක්‍රියාත්මක වන බව ප්‍රකාශ කරන ලදි.<br>වසර 2030 වන විට වරාය මූලික කරගත් නිදහස් කර්මාන්ත හා වෙළඳ කළාපයක් ඇති කිරීම, පිබිදෙන පාරිසරික සංචාරක කලාපයක් බිහි කිරීම හා නාවික, වෙළඳ, මූල්‍ය, වාණිජ හා සේවා සැපයුම් මධ්‍යස්ථානයක් බවට පත්කිරීම මෙහි අරමුණු වන බව ප්‍රකාශ කරන ලදි.<br>යටිතල පහසුකම්, සෞඛ්‍ය, සේවා සැපයුම්, ජලය හා විදුලිය සැපයුම්, අපද්‍රව්‍ය කළමනාකරණය, ආර්ථික සංවර්ධනය, සංචාරක සංවර්ධනය ආදිය කෙරෙහි අවධානය යොමු කරමින් සැලැස්ම සකස් කර ඇති බවට වාර්තා විය. | කෞතුකාගාරයක් සඳහා ද ඉඩමක් වෙන් කිරීම සම්බන්ධයෙන් සොයා බලන ලෙස උපදෙස් ලබා දුනි.<br>කෞතුකාගාරය සහිත පැරණි කච්චේරි ඉඩම සංස්කෘතික අරමුදලට ලබා දී කෞතුකාගාරයක් වෙනුවෙන් වෙන් කිරීම දුසුදු බවට ද තීරණය විය. | නාගරික සවර්ධන අධිකාරිය / |
| **04** | **ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලින් ඉදිරිපත් වී ඇති ගැටළු** | | | | |
| 4.1 | මාර්ග සංවර්ධන | බන්ධනාගාර පරිශ්‍රයේ පවත්වාගෙන යන අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ලට පිවිසෙන මාර්ග සකස් කිරීම ප්‍රමාද වීම | තාවකාලිකව සකසා ඇති පිවිසුම් මාර්ගය අබලන් තත්ත්වයේ පවතින බැවින් නිලධාරීන් හා සේවා ලබා ගැනීමට පැමිණෙන මහ ජනතාව මහත් අපහසුතාවයට පත් වී ඇති බව ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රකාශ කරන ලදි. | මෙය අත්‍යාවශ්‍ය කරුණක් සේ සලකා සති දෙකක කාලයක් ඇතුළත මාර්ගය සකස් කරන ලෙස උපදෙස් ලබා දුනි | ප්‍රාදේශීය ඉංජිනේරු - මාර්ග සංවර්ධන අධිකාරිය |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 4.2 | සෞඛ්‍ය | තංගල්ල මූලික රෝහලේ දැඩි සත්කාර ඒකකය අක්‍රියව පැවතීම | සුනාමි ව්‍යවසනයෙන් පසු ඉදිකර ඇති මෙම ගොඩනැගිල්ලෙහි මේ වන තෙක් වහලය සවිකර නොමැති අතර, එම හේතුවෙන් ගොඩනැගිල්ලේ ඉහල මාලයේ ස්ලැබ් අබලන් වී ඇති බවත්, වර්ෂා කාලවලදී දැඩිසත්කාර ඒකකය තෙමීම නිසා එය භාවිතයට සුදුසු මට්ටමේ නොමැති බවත්, මේ වන විට ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීම සඳහා මූලික කටයුතු සිදුකරමින් පවතින බව වාර්තා විය. | මහජන ප්‍රයෝජනයට ගත හැකි පරිදි කඩිනමින් ප්‍රතිසංස්කරණය කරන ලෙස උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| 4.3 | ක්‍රීඩා | තලහගම්මාඩුව පහල ග්‍රාම නිලධාරී වසමේ අරුණ ක්‍රීඩා සමාජයේ වෙරළ වොලිබෝල් ක්‍රීඩා පිටිය සඳහා මුහුදු වැලි ලබා ගැනීම. | දිවයිනේ දක්ෂතම ක්‍රීඩකයන් මෙම ක්‍රීඩා සමාජය නියෝජනය කරන බවත්, ක්‍රීඩා පිටිය සඳහා වැලි කියුබ් 40ක් පමණ අවශ්‍ය වන බවත්, එම වැලි ධීවර වරාය නීතිගත සංස්ථාවෙන් මිළදීගත හැකි බවත් වාර්තා විය. | මේ සඳහා අවශ්‍ය මුදල් දකුණු පළාත් ආණ්ඩුකාර කාර්යාලයෙන් ඉල්ලීම් කරන ලෙස දන්වන ලදි. | ප්‍රාදේශීය ලේකම් - ඕකෙවෙල |
| 4.4 | පොදු | ඕකෙවෙල නිහිළුව මාර්ගයේ අධික වේගයෙන් හා අපරික්ෂාකාරී ලෙස ගොඩනැගිලි ද්‍රව්‍ය පැටවූ වාහන ගමන් කිරීම නිසා එම මාර්ගය භාවිතා කිරීම අනාරක්ෂිත වීම | ගොඩනැගිලි ද්‍රව්‍ය පැටවූ වාහන අධික වේගයෙන් ගමන් කරන බවත්, ජීවිත අහිමි වීමේ අවදානමක් පවා පවතින බවත් වාර්තා විය. තව ද, මාර්ගයේ ගැටිති (Bumps) යෙදීමට ද ඉල්ලීම් කරන ලදි. | ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ගයක බාධක යෙදීම ප්‍රායෝගික නොවන බැවින් වේග සීමා තීරණය කර එම කටයුතු නියාමනය කරන ලෙසත්, අදාල නීතිමය පියවර ගන්නා ලෙසත් උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ඉංජිනේරු - දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය / සහකාර පොලිස් අධිකාරී - තංගල්ල |
| 4.5 | මාර්ග සංවර්ධන | වලස්මුල්ල දෙයියන්දර මාර්ගයේ කිවුලමුල්ල හංදියේ සිට කිලෝමීටර 1.8ක පමණ මාර්ගය අබලන් වීම | මාර්ගයේ අයිතිය පිළිබඳ ගැටළුවක් බවතින බවත්, කාපට් කිරීමේ හැකියාවක් නොමැති බවත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දන්වන ලදි. | මාර්ගයේ අයිතිය හඳුනාගෙන ඉදිරි කටයුතු කිරීමට තීරණය විය. | ප්‍රාදේශීය ලේකම් - ඕකෙවෙල |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 4.6 | අධ්‍යාපන | හ/ හම්බන්තොට මුස්ලිම් ප්‍රාථමික විද්‍යාලයේ නම වෙනස් කිරීම | ජාතිකත්වය හැඟවෙන ලෙස පාසල් නම් කිරීම තහනම් කොට චක්‍රලේඛයක් ඉදිරිපත් වී ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br>අල් නූර් ප්‍රාථමික විද්‍යාලය ලෙස නම් කිරීම සුදුසු බවට යෝජනා විය. | ඒ සඳහා කමිටුවේ අනුමැතිය ලබා දුන් අතර ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට තීරණය විය. | කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ - හම්බන්තොට |
| 4.7 | ජල සම්පාදන | බුන්දල සිරියාගම ග්‍රාම නිලධාරී වසම්වල පානීය ජලය භාවිතය සඳහා සුදුසු නොවීම | ලුණුගම්වෙහෙර ඒකාබද්ධ ජල යෝජනා ක්‍රමය යටතේ මෙම ප්‍රදේශයට ජලය ලබා දෙන බවත්, වසරේ මාස 04ක දී පමණක් ජලයේ ලවණ ගතිය වැඩි වීම නිසා පානීය අවශ්‍යතාවය සඳහා එම ජලය සුදුසු මට්ටමේ නොපැවතීම හේතුවෙන් ගැටළු මතු වී ඇති බවත් වාර්තා විය. | එම කාලවල දී බවුසර මඟින් අවශ්‍ය ජලය ලබාදීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට / පළාත් පාලන සහකාර කොමසාරිස් |
| 4.8 | වනජීවී | හම්බන්තොට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සඳහා අලි වැටක් ලබා දීම | හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අලිවැටටම සම්බන්ධ කොට වැටක් සවිකළ හැකි බවට වනජීවී දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශ කරන ලදි. | මේ පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කිරීමට තීරණය විය. | සහකාර අධ්‍යක්ෂ- වනජීවී |
| 4.9 | අධ්‍යාපන | හ/ථේරපුත්ත ප්‍රාථමික විද්‍යාලයේ දැල්වැට සකස් කිරීම | විද්‍යාලයේ දැල් වැට අබලන් වී ඇති බවත් වැසි කාලවලදී ජලය පිරීම නිසා කිඹුලන් ගැවසෙන බැවින් එය අනතුරුදායක බවත් වාර්තා විය. | පාසල් සංවර්ධන කමිටුවෙදී එකඟතාවයකට පැමිණ ශ්‍රම දායකත්වය ද සහිතව ප්‍රතිසංස්කරණය කිරීමටත් අදාල ඇස්තමේන්තු සකස් කර ගරු දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් වෙත යැවීමට තීරණය විය. | ප්‍රාදේශීය ලේකම් - අම්බලන්තොට / කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ - හම්බන්තොට |
| **05** | **පළාත් පාලන ආතනවලින් ඉදිරිපත් වී ඇති ගැටළු** | | | | |
| 5.1 | මාර්ග සංවර්ධන | තංගල්ල, කදුරුපොකුණ අනන්තරා හෝටලය ඉදිරිපිට මාර්ගයේ අබලන් වූ පාලම පිළිසකර කිරීම | මෙම පාලම ප්‍රතිසංස්කරණය නොකිරීම නිසා ගමනාගමන අපහසුතා පැනනැගී ඇති බව වාර්තා විය. | පාලම පිළිසකර කිරීම සඳහා වෙනම ඇස්තමේන්තුවක් සකස් කර ඉදිරි කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | සභාපති - තංගල්ල ප්‍රාදේශීය සභාව |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 5.2 | පොදු කටයුතු | හම්බන්තොට මහ නගර සභාව සඳහා ගිනි නිවීමේ ඒකකයක් ස්ථාපිත කිරීම | මේ සම්බන්ධයෙන් මීට පෙර ද අවස්ථා කිහිපයක දී ඉල්ලීම් කර ඇතත්, මේ දක්වා ක්‍රියාත්මක නොවූ බවට කරුණු ඉදිරිපත් විය. | කරන ලද ඉල්ලීම්වලට අදාල ප්‍රගතිය සොයා බැලීමට තීරණය විය. | පළාත් පාලන සහකාර කොමසාරිස් / නාගරික කොමසාරිස් - හම්බන්තොට |
| 5.3 | විදුලි බල | කලවැල්වල ආනන්ද බොධි විහාරස්ථානයට විදුලිය ලබා දීම | මෙම පන්සල මහවැලි ඉඩමක පිහිටා ඇති බවත්, පදිංචි සනාථ කරගැනීමට නොහැකි වී ඇති බවත්, මෙම පන්සල සඳහා අනුමැතිය ලබා දිය නොහැකි බවට බෞද්ධ කටයුතු අමාත්‍යාංශය මඟින් ද දන්වා ඇති බවත් මහවැලි අධිකාරි විසින් ප්‍රකාශ කරන ලදි.<br>අනුකූලතා ලියවිල්ලක් මඟින් තාවකාලික විදුලිය ලබා දිය හැකි බව විදුලිබල මණ්ඩලය ප්‍රකාශ කරන ලදි. | විදුලිය ලබා ගැනීම මූලික අවශ්‍යතාවයක් සේ සලකා ඉඩමේ අයිතිය තහවුරු කෙරෙන ලේඛනයක් නොවන බවටත් කොන්දේසියක් ඇතුළත් කරමින් ඉදිරිපත් කරන අනුකූලතා සහතිකයක් මත පදනම්ව විදුලිය ලබා දීමට තීරණය වූ අතර, එම සහතිකය ලියා දෙන ලෙස දන්වන ලදි. | ගරු සභාපති - හම්බන්තොට ප්‍රාදේශීය සභාව / ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට / ප්‍රධාන ඉංජිනේරු - විදුලිබල මණ්ඩලය |
| 5.4 | පොදු කටයුතු | වැලිපටන්විල මා දැල් වරායට ඔබ්බෙන් පිහිටි ස්වාභාවික මුහුදු තීරයේ පිහිටා ඇති “කොච්චම” නම් දිය නාන ස්ථානය සංවර්ධනය කිරීම. | රජය සතුව පවතින මෙම කොටස ප්‍රාදේශීය සභාවට පවරන්නේ නම් එම ස්ථානයේ නඩත්තු කටයුතු සිදු කළ හැකි බව ප්‍රකාශ කරන ලදි. | මේ පිළිබඳ ඉල්ලීමක් වෙරළ සංරක්ෂණ අධිකාරියට යොමු කරන ලෙසත්, ඒ අනුව පැවරීමේ කටයුතු සිදු කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | සභාපති - ප්‍රාදේශීය සභාව, අම්බලන්තොට / වෙරළ සංරක්ෂණ අධිකාරිය |
| 5.5 | සනීපාරක්ෂක කටයුතු | මදුනාගල කසළ බැහැර කරන භූමියේ අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම | මේ සඳහා හෙක්ටයාර 2ක පමණ ප්‍රමාණයක් වෙන් කර ඇති බවත්, දීර්ඝ කාලයක් තිස්සේ ගැටළුවකින් තොරව එම ස්ථානය කසළ බැහැර කිරීම සඳහා යොදා ගත් බවත්, මේ වන විට ඒ ආසන්නයේ සිටින අනවසර පදිංචිකරුවන්ගෙන් බාධා එල්ලවන බවත් සූරියවැව ප්‍රාදේශීය සභා සභාපති විසින් ප්‍රකාශ කරන ලදි. | මේ සඳහා වෙන් කර ඇති භූමිය වෙන් කොට වැටක් ගැසීම සුදුසු බවට තීරණය විය. | සභාපති - සූරියවැව ප්‍රාදේශීය සභාව |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 5.6 | මාර්ග සංවර්ධන | තංගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ග සංවර්ධන හා ප්‍රතිසංස්කරණ කටයුතු ප්‍රාදේශීය සභාවට පවරා දීම. | ඇතැම් මාර්ග ප්‍රතිංස්කරණ කටයුතුවලදී ගැටළු සහගත තත්ත්වයක් පවතින බැවින් සහ ඇස්තමේන්තු සකස් කිරීමේ දී ප්‍රාදේශීය සභාවල උපදෙස් පිළිනොගන්නා බැවින් මෙම ප්‍රතිපාදන ප්‍රාදේශීය සභාවට පැවරීමට කටයුතු කරන ලෙස ඉල්ලීම් කරන ලදි.<br>අක්‍රමවත් ආකාරයට මාර්ග සකස් කරන්නේ නම් ඒ පිළිබඳව වහාම දැනුවත් කරන ලෙසත්, එවැනි අවස්ථාවක අදාල නිධාරීන් සමඟ පරීක්ෂා කර ඊට විසඳුම් ලබා දිය හැකි බවත්, එමෙන් ම, දෙපාර්තමේන්තු ප්‍රධානියා ලෙස මුදල් රෙගුලාසිවලින් පැවරී ඇති වගකීම් අනුව ලැබෙන ප්‍රතිපාදන වෙනත් ආයතනවලට පැවරීම කළ නොහැකි බවත් දිස්ත්‍රික් ලේකම් විසින් දැනුම් දෙන ලදි.<br>රජයේ සංවර්ධන අවශ්‍යතාවයන්වලට අදාලව ලැබෙන යෝජනා ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින බැවින් ලැබෙන මාර්ග ප්‍රතිසංස්කරණ යෝජනා අදාල පළාත් පාලන ආයතනවලට යොමු කර ඒ සඳහා එකඟතාවය ලබාගන්නා අතර, ඇස්තමේන්තුවේ පිටපතක් ද එම ආයතනයට ලබා දෙන බවත්, ඇතැම් පළාත් පාලන ආයතන හේතු දැක්වීමකින් තොරව එකඟතාවය ලබා දීම හිතාමතාම ප්‍රමාද කරන බවත් දන්වන ලදි. | මීට පෙර සම්බන්ධීකරණ කමිටුවලදී ඇතිකර ගත් එකඟතා අනුව කටයුතු කරන ලෙසත්, මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතුවල ඇති ගැටළු පිළිබඳ නිශ්චිත තොරතුරු දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දෙන ලෙසටත් තීරණය විය. | සියළුම ප්‍රාදේශීය සභා සභාපතිවරුන් |
| 06 | **විශේෂ යෝජනා** | | | | |
| 6.1 | මාර්ග සංවර්ධන | හම්බන්තොට වියළි කලාපීය උද්භිද උද්‍යානය වෙත පිවිසෙන මාර්ගවල මග පෙන්වීම් පුවරු සවි කිරීම | අදාල පුවරු මේ වන විට සකස් කරමින් පවතින බව වාර්තා විය. | මේ සම්බන්ධ කටයුතු සොයා බලා කඩිනමින් ඉටු කිරීමට තීරණය විය. | උද්‍යාන භාරකරු - වියළි කලාපීය උද්භිත උද්‍යානය |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 6.2 | වාරි මාර්ග | වලව දකුණ ඉවුර ප්‍රධාන ඇල මාර්ගයේ ජලය බෙදා හැරීම නතර කිරීම. | දකුණු ඇල ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර ඇති බැවින් මෙම ගැටළු මතු වී ඇති බව වාර්තා විය. | මේ පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | වාරිමාර්ග ඉංජිනේරු |
| 6.3 | පොදු සේවා | කටුවන හා වීරකැටිය ආදාහනාගාර මහජන භාවිතයට පවරා දීම ප්‍රමාද වීම. | 2014 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භකර 2016 වර්ෂයේදී අවසන් කර ඇති මෙම ව්‍යාපෘති මෙතෙක් මහජන භාවිතයට විවෘත කර නොමැති බවත්, එම හේතුවෙන් රැඳවුම් මුදල් නිදහස් කිරීමට ද නොහැකිවීම නිසා කොන්ත්‍රාත් ආයතන නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සූදානම් වී ඇති බවත්, විශාල මුදලක් වැය කොට ඉදිකර ඇති මෙම ව්‍යාපෘති භාවිතයට නොගැනීම සම්බන්ධයෙන් විගණන විමසීමක්ද සිදු කර ඇති බවත්, වගකීම් කාලය ද මේ වන විට අවසන් වී ඇති බවත් අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) විසින් ප්‍රකාශ කරන ලදි.<br>ආදාහනාගාරවල වැසිකිළි පහසුකම් නොමැති නිසා භාවිතා කිරීම සිදු නොවී ඇති බව පළාත් පාලන කොමසාරිස් විසින් දන්වන ලදි. | එම අඩුපාඩු මෙතෙක් සම්පූර්ණ කර නොගැනීම ගැටළු සහගත බව ප්‍රකාශ කරන ලදි. අවශ්‍ය පහසුකම් කඩිනමින් දියුණු කර භාවිතයට ගැනීමට කටයුතු කරන ලෙසත්, භාවිතයට ගත් බව දැනුම් දීමට කටයුතු කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | වීරකැටිය හා කටුවන ප්‍රාදේශීය සභා ගරු සභාපතිවරුන් |
| 6.4 | ඉඩම් | හම්බන්තොට ගොන්නෝරුව මීගහජඳුර මාර්ගය පුළුල් කිරීම සඳහා අත්පත් කරගත් ඉඩම් වෙනුවෙන් වන්දි ගෙවීම ප්‍රමාද වීම | ඉඩම් තක්සේරු කිරීම සඳහා මායිම් පෙන්වීමේ දී ගැටළු මතු වී ඇති බැවින් නැවත මැනුම් කිරීමට කටයුතු යොදා ඇති බව වාර්තා විය. | අදාල මැනුම් නියෝග මත තක්සේරුවෙන් අනතුරුව වන්දි ගෙවීම් කටයුතු සිදු කර ප්‍රගතිය වාර්තා කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට / මාර්ග සංවර්ධන අධිකාරිය / දිස්ත්‍රික් තක්සේරු කාර්යාලය |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 6.5 | ගමනාගමන | කිරින්ද සිට ගැටමාන්න බෙලිඅත්ත හරහා හම්බන්තොට දක්වා ධාවනය වන කාර්යාල ප්‍රවාහන සේවා බස්රථය සඳහා අනුමැතිය ලබා ගැනීම | මෙම බස් රථයේ නිලධාරීන් 50කට අධික පිරිසක් පැමිණෙන අතර, පෞද්ගලික බස් හිමියන් විසින් මේ සඳහා බාධා පමුණුවන බව වාර්තා විය.<br>දෛනික ගාස්තු අයකර ගනිමින් කාර්යාල සේවා බස් සේවාවක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් බලපත්‍ර ලබා දීමක් සිදු කළ නොහැකි බව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් ප්‍රකාශ කරන ලදි.<br>පොදු ප්‍රවාහන සේවාවේ පවතින මන්දගාමී බව කාර්යාල කටයුතුවලට බෙහෙවින් බලපාන බවත්, කාර්යාල නිලධාරීන්ට කුලියට ගත් බස් රථයකින් කාර්යාලවලට පැමිණීමට හැකියාව තිබිය යුතු බවත්, දිස්ත්‍රික් ලේකම් විසින් දන්වන ලදි. තව ද, කිරින්ද සිට හම්බන්තොට දක්වා බස්රථයක් යොදවා නැති බැවින් එම නිලධාරීන් බස් රථ 03ක ගමන්කිරීමට සිදු වීම අනවශ්‍ය ලෙස කාලය අපතේ යැවීමක් බවත් දන්වන ලදි.<br>ප්‍රඥප්තියට අනුව ඒ සඳහා අවසරයක් ලබාදිය නොහැකි බව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් දන්වන ලදි. | කිරින්ද සිට හම්බන්තොට දක්වා පොදු ප්‍රවාහන සේවයක් ස්ථාපිත කර කාර්යාල නිලධාරීන් පමණක් කාර්යාල තුළට ගමන් කිරීම සඳහා යම් පහසු ක්‍රම වේදයක් යොදාගෙන ඇත්නම් එය නීති විරෝධී විය නොහැකි බවත්, එබැවින් ඒ සඳහා ඉඩ ලබා දිය යුතු බවත් තීරණය විය.<br>SP NC 2546 බස් රථය කාර්යාල වේලාවන්හි එම නිලධාරීන් ප්‍රවාහනය කිරීම සුදුසු බවට තීරණය වූ අතර, එම පහසුකම් සැලසීමට ප්‍රඥප්තියේ වගන්ති බාධාවක් වේ නම් ඒවා සංශෝධනය කරන ලෙස දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් දන්වන ලදි.<br>මෙම බස් රථයේ ගමන් කරන සියළුම රජයේ නිලධාරීන් අනුබද්ධ නිලයන් හා ඒ ඒ කාර්යාල විස්තරද සහිතව බස්රථයේ ප්‍රදර්ශනය කරන ලෙසද දැන්විය. | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය. |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 6.6 | මත්ද්‍රව්‍ය නිවාරණ | ජුල්පල්ලම ග්‍රාම නිලධාරී වසමේ පවත්වාගෙන යන රා පොල හේතුවෙන් පැන නැගී ඇති ගැටළු | ප්‍රදේශයේ තරුණ පරම්පරාව මේ සඳහා ගොදුරු වී ඇති බවත් ඒ මගින් සමාජීය ගැටළු පැනනැගී ඇති බවත් වාර්තා විය. | රා මැදීමට පමණක් බලපත්‍ර ලබාගෙන රා විකිණීම කරන්නේ නම් ඒ පිළිබඳ නීතිමය පියවර ගැනීම සුදුසු බව තීරණය විය. දැනටමත් නඩු පවරා ඇති බව සහකාර පොලිස් අධිකාරී පවසන ලදි. | ප්‍රාදේශීය ලේකම් - තිස්සමහාරාමය / සුරාබදු අධිකාරී / සහකාර පොලිස් අධිකාරී - හම්බන්තොට |
| **07** | **දේශපාලන නායකත්වයෙන් ඉදිරිපත් වී ඇති ගැටළු** | | | | |
| **7.1** | **ධීවර හා ජලජ සම්පත් සංවර්ධන හා ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ ගරු රාජ්‍ය අමාත්‍ය දිලිප් වෙදආරච්චි මැතිතුමා** | | | | |
| 7.1.1 | ඉඩම් | හම්බන්තොට දිස්ත්‍රික් වාණිජ මණ්ඩලයට සම්පත් මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ඉඩමක් ලබා ගැනීම | | මේ පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ- නාගරික සංවර්ධන අධිකාරිය, ප්‍රාදේශීය ලේකම්- හම්බන්තොට |
| 7.1.2 | වාරි මාර්ග | වලස්මුල්ල බෝවල බටහිර ග්‍රාම නිලධාරී වසමේ සිතුල්පා වැව ප්‍රතිසංස්කරණය කිරීම | | ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන මෙන් උපදෙස් ලබා දුනි. | සහකාර කොමසාරිස් - ගොවිජන සේවා දෙපාර්තමේන්තුව |
| 7.1.3 | ඉඩම් | සුනාමි ගම්මානයක් ඉදිකිරීම සඳහා නෙටොල්පිටිය පුරාණ විහාරස්ථානයෙන් ලබා දී ඇති ඉඩම රජයට පවරා ගැනීම | මෙම ඉඩම නීත්‍යානුකූල ලෙස භාරගෙන නොමැති බවත්, වර්තමාන නායක ස්වාමීන් වහන්සේ විසින් වන්දි ඉල්ලා ඇති බවත් වාර්තා විය. | සාමූහික ප්‍රතිපාදන මත වන්දි මුදල් ලබා දීමටත්, පවරා ගැනීම නිසි පරිදි සිදු කිරීමටත් උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - තංගල්ල |
| **08** | **ලිපි ලැබීම් / පසුව ලැබුණු ලිපි** | | | | |
| 8.1 | කෘෂිකර්ම | කෘෂීන්ගෙන් හානි වූ කෙසෙල් වගාවන් සඳහා වන්දි ලබා දීම | කෘෂි රක්ෂණ මණ්ඩලය මගින් වන්දි ලබා දීමට යම් උත්සාහයක් ගත හැකි බව වාර්තා විය. | පවතින අධික සුළං තත්ත්වය මත විශේෂ අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | ආපදා කළමනාකරණ ඒකකය |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 8.2 | මාර්ග සංවර්ධන | ලංසි වත්ත බස් නවතන ස්ථානය සලකුණු නොකිරීම | බස් නවතන ස්ථානය තීරණය කර කාලයක් ගත වී ඇතත් මේ වන තෙක් දැන්වීම් ප්‍රදර්ශනය නොකිරීම හේතුවෙන් බස් රථ නතර නොකරන බව වාර්තා විය. | මේ පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | මාර්ග සංවර්ධන අධිකාරිය, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය |
| 8.3 | නගර සංවර්ධන | පරිපාලන සංකීර්ණය ඉදිරිපිට අනවසර කඩ ඉවත් කිරීම | මීට පෙර අවස්ථා කිහිපයක දී ම මේ පිළිබඳ දන්වා ඇතත් මේ වන තෙක් කඩ ඉවත් කිරීම සිදු කර නොමැති බව වාර්තා විය. | කඩ ඉවත් කිරීම සඳහා අදාල නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවට තීරණය විය. | මාර්ග සංවර්ධන අධිකාරිය / නාගරික සංවර්ධන අධිකාරිය / ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට |
| 8.4 | උසස් අධ්‍යාපන | කොළඹ විශ්ව විද්‍යාලයේ කෘෂි තාක්ෂණ විද්‍යාලය සඳහා ඉඩම ලබා දීම | මේ සඳහා අක්කර 300ක් වෙන් කර පළමු අදියරට අක්කර 50ක භූමියක් ලබා දී ඇත.මේවන විට එම අක්කර 50ක භූමිය සංවර්ධනය කර අවසන් බැවින් ඉතිරි අක්කර 250 ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි. | ඉතිරි ඉඩම් කොටස ලබා දීම සම්බණ්ධයෙන් ඉඩම් පරිහරණ කමිටුවේ අනුමැතිය ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - ලුණුගම්වෙහෙර |
| 8.5 | ඉඩම් | හම්බන්තොට නව රෝහල සංවර්ධයෙන් පසු ව්‍යාපාර අහිමි වූවන් සඳහා විලක්ප ඉඩම් ලබා දීම. | රෝහල ආසන්නයේ අක්කර 32 ක ඉඩම මේ සඳහා සුදුසු බවත්, මහවැලි අධිකාරිය මේ වන තෙක් නගර සභාවට ඉඩම පවරා නොමැති බවත් වාර්තා විය.<br>එකී ඉඩම් පවරා දෙන්නේ නම් සතියක් ඇතුලත තාවකාලික ඉදිකිරීම් සිදු කළ හැකි බවත් දන්වන ලදි. | එම ඉඩම නගර සභාවට පවරා දීමට කටයුතු කරන ලෙසත්, ව්‍යාපාරිකයන් සඳහා විසඳුම් ලබා දීමට කඩිනමින් කටයුතු කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | පළාත් පාලන සහකාර කොමසාරිස් / නාගරික සංවර්ධන අධිකාරිය |
| **09** | **වෙනත් ගැටළු** | | | | |
| 9.1 | සංවර්ධන කමිටු | ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටු නිසි පරිදි නොපැවැත්වීම | සම සභාපතිවරුන්ගේ පත්වීම සම්බන්ධයෙන් ගැටළු පවතින බැවින් ඕකෙවෙල, වලස්මුල්ල, තිස්සමහාරාමය, කටුවන හා ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පැවැත්වීමට නොහැකි වූ බව වාර්තා විය. | සම සභාපතිවරුන් පත් කරන තෙක් විකල්පයක් ලෙස ප්‍රගති සමාලෝචන රැස්වීම් ලෙස කමිටු පැවැත්වීමට උපදෙස් ලබා දුනි. | සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් |
| 9.2 | ඉඩම් | දෙබරවැව තාවකාලික නිවාසවල ජීවත් වන පවුල් 74ක් සඳහා ඉඩම්වල අයිතිය ලබා දීම | මෙම ඉඩම රජයේ ඉඩමක් ලෙසින් නම් කර ඇති බවත්, වන්දි ගෙවීම සඳහා විශාල මුදලක් වැය වන බවත් වාර්තා විය. | ඉඩම් පරිහරණ කමිටුවට ඉදිරිපත් කර එහි නිර්දේශ ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - තිස්සමහාරාමය |

| අ.අ | විෂය ක්ෂේත්‍රය | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|---|
| 9.3 | ආරක්ෂක | දෙබරවැව පාසල අසල නවතා ඇති කන්ටේනර් රථ 02 ඉවත් කිරීම | ඉවත් කර ගන්නා ලෙස දන්වා නැවත සිහිකැඳවීම් ද කර ඇති බව වාර්තා විය. | ආරක්ෂක හේතූන් ද පදනම් කර ගනිමින් මහජන පීඩාකාරී පනත යටතේ නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ඉංජිනේරු - මාර්ග සංවර්ධන අධිකාරිය / සහකාර පොලිස් අධිකාරී - හම්බන්තොට |
| 9.4 | කෘෂිකර්ම | ලුණුගම්වෙහෙර හේන් ගොවීන්ගේ ගොවි බිම් හෙළි පෙහෙළි කිරීමට අවසර ගැනීම | දීර්ඝ කාලීන වශයෙන් හේන් ගොවිතැන කරගෙන ආ ගොවීන්ගේ බිම් සඳහා ගැටළුවක් නොමැති බව දිසා වන නිලධාරී විසින් ප්‍රකාශ කරන ලදි. | පාරම්පරික හේන් ගොවිතැන් සඳහා අවස්ථාව ලබා දිය යුතු බවත්, හේන් ගොවීන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | දිසා වන නිලධාරී - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br><br>ප්‍රාදේශීය ලේකම් - ලුණුගම්වෙහෙර |
| 9.5 | ඉඩම් | ස්වර්ණමාලී ගොවි සමිතියේ සාමාජිකයන් සඳහා බලපත්‍ර ලබා දීම | කැලියපුර වැවෙන් පෝෂණය වන ප්‍රදේශයේ අනවසර වගාකරුවන් සම්බන්ධයෙන් මූලික සමීක්ෂණ සිදු කර පුද්ගලයින් 47 දෙනෙකු තෝරාගෙන ඇති බවත්, එක් අයෙකුට අක්කර 02 බැගින් බලපත්‍ර ලබා දීම සඳහා අවශ්‍ය අනුමැතිය නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් වෙතින් ඉල්ලීම් කර ඇති බවත් වාර්තා විය. | මෙ සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා දුන් අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට තීරණය විය. | ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට / නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්. |

මීළඟ රැස්වීම්වලදී න්‍යාය පත්‍රයට අදාල නොවන කරුණු ඉදිරිපත් කිරීම සිදු නොකරන ලෙසත්, කැඳවීමේ ලිපිය එවා ඇති අය පමණක් ශාලාවට ඇතුළත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත් දැන්වීමෙන් අනතුරුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් කමිටුවේ සියළුම සාමාජිකයන් වෙත ස්තූතිය පිරිනමමින් ප.ව 03.00 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය.

මීළඟ රැස්වීම පැවැත්වෙන දිනය දැනුම් දෙනු ලැබේ.

**එම්.කේ.බන්දුල හරිශ්චන්ද්‍ර**
**දිස්ත්‍රික් ලේකම්/ දිසාපති**
**හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය**

එම්. කේ. බන්දුල හරිශ්චන්ද්‍ර
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට.

2019 ජූලි මස ......31...... දින
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.